දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary: 2784812
කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය" බත්තරමුල්ල.
"இசுருபாயா" பத்தரமுல்ல.
"Isurupaya" Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ........................................

මගේ අංකය / எமது இல. / My No. } ඡඩ /03/38/2/7/01
තොරතුරු හා සන්නිවේදන.....
තාක්ෂණ අධ්‍යාපන ඒකකය
2006.01. 19

දිනය / திகதி / Date } ........................................

චක්‍රලේඛ අංකය :- 2006/06

සියළුම පළාත් ලේකම්වරුන් වෙත
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත
සියළුම විදුහල්පතිවරුන් වෙත

තොරතුරු හා සන්නිවේදන ( ICT ) තාක්ෂණ ශිෂ්‍ය සමාජ ව්‍යාපෘතිය

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ (GIT) විෂය පාසල් පද්ධතියට හඳුන්වාදීමට සමගාමීව විෂය හා විෂය බාහිර ක්‍රියාකාරකම් වර්ධනය, සංවර්ධනය කිරීම හා තොරතුරු තාක්ෂණ විෂයට අදාලව ශිෂ්‍ය රුචිකත්වය වර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් වශයෙන් තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සමාජ ක්‍රියාත්මක කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය ගත් තීරණයට අනුව 2004 වර්ෂයේ දී ශිෂ්‍ය සමාජ ආරම්භ කරන ලදී. ආරම්භ කර ඇති ශිෂ්‍ය සමාජ නැවතත් පණගැන්වීමටත් ශිෂ්‍ය සමාජ ආරම්භ නොකළ විදුහල්වල මීට පෙර ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාවට අනුකූලව ආරම්භ කිරීමටත් අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විෂය ( GIT ) භාර ගුරු භවතා හෝ එසේ නොවන පාසල වල 10 ශ්‍රේණිවල තොරතුරු තාක්ෂණ විෂය භාර ගුරු භවතා හෝ වෙනත් සුදුසු ගුරු භවතකු තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සමාජය භාර ආචාර්යවරයා වශයෙන් කටයුතු කළ යුතු අතර මෙයට අමතරව තොරතුරු තාක්ෂණය පිළිබඳව පුහුණුව ලැබූ ගුරුවරු අතරින් දෙදෙනෙකු ශිෂ්‍ය සමාජයේ කටයුතු මෙහෙයවීම සඳහා යොදවා ගත හැකිය.

ශිෂ්‍ය සමාජ ව්‍යවස්ථාව මේ සමග අමුණා ඇති අතර පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

- ආදර්ශ ව්‍යවස්ථාවට අනුව තිළවරණ පැවැත්විය යුතු අතර ශිෂ්‍ය සමාජයේ කටයුතු මෙහෙයවීම සඳහා ගුරු හා ශිෂ්‍ය නියෝජනය සහිත මෙහෙයුම් කමිටුවක් පත් කළ යුතු අතර එම කමිටුව මසකට වරක් රැස්විය යුතුය.
- තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සමාජය සඳහා ලැබෙන සාමාජිකයින්ගේ පරිත්‍යාග මුදල්. බාහිර පරිත්‍යාග ආධාර ආදිය පාසල් සංවර්ධන ගිණුමේ ඒකාබද්ධ ගිණුමක් වශයෙන් පවත්වාගෙන යා යුතුය.
- තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සම්ජයට අදාලව පුස්තකාල පවත්වාගෙන යාම හා භාණ්ඩ වට්ටෝරු තබා ගැනීම කළ යුතුය.
- විශ්ව අභියෝග ජයගත හැකි සිසු පරපුරක් පාසල් පද්ධතියෙන් සමාජයට බිහි කිරීම සඳහා වූ දර්ශනය වෙනුවෙන් තොරතුරු තාක්ෂණ විෂය ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයකට ඉවහල් කර ගනිමින් ඉදිරියට ගෙන යාම අපේක්ෂිතය.
- තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සමාජ සඳහා තරග සංවිධානය. සඟරා. බිත්ති ලිපි. පුවත්පත් පවත්වාගෙන යාම. ප්‍රදර්ශන. දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය කිරීමේ හැකියාව ඇති අතර තරග ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග ප්‍රදානය සඳහා කටයුතු කිරීමට තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සමාජයට හැකියාව ඇත.

- පාසල් අතර තොරතුරු තාක්ෂණ දැනුම හුවමාරු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම සිදුකළ හැක.

ශිෂ්‍ය සමාජ සම්බන්ධ සංවර්ධනාත්මක උපදෙස් හා ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු තාක්ෂණ විෂය සම්බන්ධීකරණ නිලධාරීන් ( පළාත් / කලාප ) මගින් ඉදිරියේ දී දැනුම් දීමට අපේක්ෂිතය.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය

පිටපත : 1 සියළුම තොරතුරු හා තාක්ෂණ පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් ( විදුහල්පති වරුන් වෙත යොමු කිරීම සඳහා )
2 සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිෂ්‍ය සමාජ (ICT Student Clubs) සඳහා වූ ව්‍යවස්ථාව.

1. නම -

මෙම ශිෂ්‍ය සමාජය .............................................. විදුහලේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිෂ්‍ය සමාජය ලෙස හැඳින්වේ.

ලිපිනය - පාසලේ ලිපිනය

2. පරමාර්ථයන්

- ශිෂ්‍ය ප්‍රජාව කේන්ද්‍ර කොට ගෙන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම.
- පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා පිවිසෙන්නන් හට නිවැරදි මග පෙන්වීමක් ලබා දීම.
- තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට පිවිසෙන ශිෂ්‍ය ප්‍රජාව එම ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වයට පත් කිරීම සඳහා භාරකරුවකු ලෙස ක්‍රියාත්මක වීම.
- පාසල තුළ තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව වර්ධනය කිරීමේ අරමුණින් යුතුව බිත්ති පුවත්පත්, සඟරා, තරඟ, ප්‍රදර්ශන ආදී විවිධ වැඩසටහන් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර ලෝකය සමඟ ඉලෙක්ට්‍රොනික ලෙස සම්බන්ධවීමට අවශ්‍ය උපාය මාර්ග සකස් කිරීම.
- සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීම සඳහා ප්‍රජාව නැඹුරු කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ නව ප්‍රවණතාවන් පිළිබඳ ව කණ්ඩායම් හැඟීමෙන් ගවේෂණය කරන සිසු සහයෝගිතාවක් ද ඇති කිරීම.

3. සාමාජිකත්වය

| | | |
|---|---|---|
| සාමාජිකත්වය සඳහා සුදුසුකම් | - | පාසලේ 4වන ශ්‍රේණියෙන් ඉහළ ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් |
| සාමාජිකයින් බඳවා ගැනීම | - | ඉහත දැක්වෙන සුදුසුකම්වලින් යුක්ත අයකුගේ සාමාජික ඉල්ලුම් පත්‍රය කාරක සභා හෝ මහා සභා රැස්වීමක දී හෝ යෝජනා ස්ථිරත්වයෙන් පිළිගත් විට ඔහුට හෝ ඇයට සාමාජිකත්වය හිමි වේ. |

4. රැස්වීම් පැවැත්වීම

| | | |
|---|---|---|
| කාරක සභා රැස්වීම | - | සෑම මසකට වරක් විශේෂ මහා සභා රැස්වීම - කාරක සභාවෙන් තීරණය කළ විශේෂ හේතුවක් මත කැඳවිය හැකි ය. |
| වාර්ෂික මහා සභා රැස්වීම | - | ආරම්භක මහා සභා රැස්වීමේ සිට වසරක් ඇතුළත වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලැබේ. නව වර්ෂය සඳහා නිලධාරී මණ්ඩලයක් තෝරා ගැනීම මහා සභා රැස්වීමේ දී සිදු කෙරේ. |

5. ගණ පූර්ණය - මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් වේ.

6. නිල දරන්නන් - අනුශාසක (ප්‍රධාන) විදුහල්පති
- අනුශාසක (විෂය භාර ආචාර්ය)
- සභාපති
- උපසභාපති
- ලේකම්
- උපලේකම්
- භාණ්ඩාගාරික - ගුරු භවතෙක්
- උපභාණ්ඩාගාරික
- සංවිධායක
- කාරක සභාව - කාරක සභාව සඳහා සාමාජිකයන් 6 දෙනකු පත් කරගනු ලබන අතර කාරක සභාවේ ඇති වන පුරප්පාඩු පිරවීමේ බලය කාරක සභාව සතු වේ. එම පත්වීම මහා සභාවේ දී පසුව අනුමත කරනු ලැබේ.

7. නිල දරන්නන්ගේ කාර්යභාරය

| | | |
|---|---|---|
| සභාපති | - | ශිෂ්‍ය සමාජයේ කටයුතු සංවිධානය කිරීම හා සෑම ක්‍රියාකාරිත්වයක ම වගකීම සභාපති විසින් දැරිය යුතු ය. |
| උපසභාපති | - | සභාපති නොමැති අවස්ථාවල වැඩ බැලීම. |
| ලේකම් | - | ශිෂ්‍ය සමාජයේ කාරක සභාවේ තීරණ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, රැස්වීම් කැඳවීමේ වාර්තා සටහන් තබා ගැනීම හා සමිතියට අදාළ ලිපි ලේඛන, පොත් පත් පවත්වාගෙන යාම. |
| උපලේකම් | - | ලේකම් නොමැති අවස්ථාවල වැඩ බැලීම. |
| භාණ්ඩාගාරික | - | සමිතියේ මුදල් සම්බන්ධ ව අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව කටයුතු කිරීම, සමිතියේ මුදල් ගනුදෙනු සම්බන්ධ ව මුදල් වාර්තා තබා ගැනීම. |
| සංවිධායක | - | සමිතිය විසින් සිදුකරන විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, රැස්වීම් සංවිධානය කිරීම. |

8. තොරතුරු තාක්ෂණ සමාජ සම්බන්ධයෙන් ගත යුතු සියලු තීරණ හා ක්‍රියාමාර්ග විදුහල්පතිට පවතින බලතලවලට යටත් බව දන්වමි.